දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112694033, 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය ) MH/TA/15/ST/පොදු/01/2023
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය ) 2026.06.22
திகதி )
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு

# Ministry of Health & Mass Media

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ජාතික රෝහල,
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු / සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු,
සියළුම රෝහල් අධ්‍යක්ෂවරු/ වෛද්‍ය අධිකාරිවරු/ සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්.

<u>ස්ථාන මාරු මණ්ඩලය පැවැත්වීම - වාග් චිකිත්සක 2026</u>

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ වාග් චිකිත්සක නිලධාරීන්ගේ නව පත්වීම් ලබාදීමට සමගාමීව ස්ථාන මාරු මණ්ඩලය පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව ස්ථාන මාරු අයදුම් කිරීමට අපේක්ෂා කරන නිලධාරීන් හට ස්ථාන මාරු අයදුම්පත (ඇමුණුම 01) නිසි පරිදි සම්පූර්ණ කර (ආයතන ප්‍රධානියාගේ නම සහිත නිල මුද්‍රාව යොදා) 2026.06.30 දිනට පෙර **අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08** යන ලිපිනයට යොමු කරන ලෙසට සියළුම නිලධාරීන් දැනුවත් කරන ලෙසට මෙයින් දැනුවත් කරමි.

03. එමෙන්ම, පළාත් සභා සඳහා ස්ථාන මාරු අයදුම් කරන නිලධාරීන් පිරික්සුම් ලැයිස්තුව (ඇමුණුම 02) අනුව අවධානය යොමු කර ස්ථාන මාරු අයදුම්පත් යොමු කරන ලෙස දන්වා සිටිමි.

04. පළාත් සභාවේ සිට රේඛීය අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු ඉල්ලුම් කරන නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2020 (I) හා 2024.07.24 දිනැති චක්‍රලේඛයේ 02 වන පරිච්ඡේදයේ සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතු බවත් දන්වමි.

එල්.එස්. මාගමමුල්ල,
අධ්‍යක්ෂ (පාලන) 02,
ලේකම් වෙනුවට.

එල්.එස්. මාගම්මුල්ල
අධ්‍යක්ෂ (පාලන) 02
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ - 10

අත්.කලේ / චාමික එච්. ගමගේ,
අතිරේක ලේකම් (පාලන) II

## ස්ථාන මාරු ඉල්ලුම් පත්‍රය

01.නිලධාරියාගේ/නිලධාරිනියගේ සම්පූර්ණ නම :-...............................................................

...............................................................................................................

02.වර්තමාන නිල නාමය, ශ්‍රේණිය / එම ශ්‍රේණියට පත් වූ දිනය :-

...............................................................................................................

03.උපන් දිනය:-...............................................................................................

04.ජාතික හැඳුනුම්පත් අංකය:-...............................................................................

05.ස්ථිර පදිංචිය හා දිස්ත්‍රික්කය:- ..........................................................................

...............................................................................................................

06.දුරකථන අංකය:-.............................................................................................

07.විවාහක / අවිවාහක බව:- ...................................................................................

08.කලත්‍රයාගේ නම:- ..........................................................................................

09.කලත්‍රයාගේ රැකියාව සහ සේවා ස්ථානය: ..............................................................

10.(අ).පාසල් නොයන ළමයි ගණන:- .......................................................................

(ආ).පාසල් යන ළමයි පිළිබඳ විස්තර

| | නම | ශ්‍රේණිය | පාසලේ නම |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |

11.සේවය කොට ඇති සේවා ස්ථාන (වර්තමාන සේවා ස්ථානය අගට සිටින සේ සඳහන් කරන්න.)

| | ආයතන / සේවා ස්ථානය හා කොට්ඨාසය | සිට | දක්වා |
|---|---|---|---|
| I. | | | |
| II. | | | |
| III. | | | |
| IV. | | | |
| V. | | | |

12.වඩාත් කැමති රෝහල / පළාත් සභාව හා දිස්ත්‍රික්කය:- (මනාපය පරිදි අනුපිළිවෙළින් දක්වන්න)

| ආයතනය / රෝහල | පළාත් සභාව | දිස්ත්‍රික්කය |
|---|---|---|
| I. | | |
| II. | | |
| III. | | |

13.ඉල්ලුම් කිරීමට හේතු:-

14.වර්තමාන සේවා ස්ථානය වෙත මාරු කරනු ලැබීමට විශේෂ හේතු ඇතොත් ඒ කවරේද යන වග:-

දිනය:- ......................................   ..........................................

ඉල්ලුම්කරුගේ අත්සන

<u>ආයතන ප්‍රධානියාගේ නිර්දේශ:-</u>

නිර්දේශ කරමි / නොකරමි. අනුප්‍රාප්තිකයෙකු නොමැතිව ඉල්ලුම්කරු මුදාලිය හැකිය / නොහැකිය.

දිනය:- .....................................   ..............................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

# පිරික්සුම් ලැයිස්තුව

ස්ථාන මාරු අයදුම්පත සමග මෙම පිරික්සුම් ලැයිස්තුව සම්පූර්ණ කර අමුණා එවීම අනිවාර්යය වේ.

**ස්ථාන මාරුවීම් යටතේ ........ පළාත් රාජ්‍ය සේවයට ස්ථාන මාරුවී පැමිණීමේදී ලබා දිය යුතු ලියවිලි**

| | අවශ්‍ය ලේඛණ | ........ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු පිටපත් සංඛ්‍යාව | ඇමුණුම ඇත/නැත |
|---|---|---|---|
| 1. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/91 යටතේ වන ස්ථාන මාරු අයදුම්පත | මුල් පිටපත හා ඡායා පිටපතක් | |
| 2. | විධිමත් පත්වීම් ලිපිය | සහතික කළ පිටපත් දෙකක් | |
| 3. | සේවය ස්ථිර කිරීමේ ලිපිය | සහතික කළ පිටපත | |
| 4. | ජාතික හැඳුනුම්පත | සහතික කළ පිටපත | |
| 5. | ▪ සේවය ස්ථිර කර නොමැති නම්, ........ පළාත් රජ්‍ය සේවයට අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුව අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බව සනාථ කරන අධ්‍යාපන සහතිකවල **විභාග කොමසාරිස් ජනරාල් විසින්/ විශ්වවිද්‍යාල ලේඛකාධිකාරී විසින් සනාථ කරන ලද පහත සඳහන් ලියවිලි**<br>▪ අ.පො.ස.(සා.පෙ.) හා අ.පො.ස.(උ.පෙ.) විභාග ප්‍රතිඵල සටහන්<br>▪ උපාධි සහතිකය / විද්‍යාපීඨ සහතිකය / පුහුණු සහතිකය / ඩිප්ලෝමා සහතිකය සනාථ කිරීමේ ලිපියේ පිටපතක්<br>▪ වැඩ භාර ගැනීමේ ලිපියේ පිටපතක් | සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය | |
| 6. | ........ පළාත තුළ ස්ථිර පදිංචිය සහිත බව තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය (DS 04) | මුල් පිටපත | |
| 7. | නිලධාරියා දැනට දරණ ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල ලේඛන | සහතික කරන ලද පිටපත | |
| 8. | දැනට සේවයේ නියුතු විදුහල්පතිවරුන් විසින් නිකුත් කරන ලද විධිමත් ඉගැන්වීම් කාලසටහන (ශ්‍රී ලංකා ගුරු සේවයේ අයදුම්කරුවන්ට පමණි) | සහතික කරන ලද පිටපත | |
| 9. | ස්ථාන මාරුව ලබා ගැනීමෙන් පසු ........ පළාත් සභාව තුළ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කරන බවට හා ........ පළාතේ ඕනෑම සේවා | මුල් පිටපත | |

| | | | |
|---|---|---|---|
| | ස්ථානයක සේවය කිරීමට කැමැත්ත ප්‍රකාශිත ලිපිය. | | |
| 10. | පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද නිලධරයන් අදාළ තනතුරේ නියමිත ශ්‍රේණියෙහි ජ්‍යෙෂ්ඨතා ලේඛණයේ නියමිත ස්ථානයේ තැබීමේ කොන්දේසියට යටත්ව ........ පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත පළකල ලිපිය | මුල් පිටපත | |
| 11. | ස්ථාන මාරු අයදුම් කරන දිනට පූර්වාසන්න වසර 03 ක (පවත්නා වර්ෂයද ඇතුළත්ව) වැටුප් රහිත නිවාඩු ඇති / නැති බවට වාර්තාවක් (ආයතන ප්‍රධානී නිර්දේශ සහිතව) | මුල් පිටපත | |
| 12. | නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර ඇති/ආරම්භ කිරීමට සූදානම්ව ඇති / නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී ගේ සහතිකය (මෙහි විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට සූදානම්ව ඇතැයි යන්නෙන් අදහස් කෙරෙනුයේ සිද්ධියට අදාළ මූලික පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව/ඒ පිළිබඳව නිලධාරයාගෙන් නිදහසට කරුණු විමසා තිබීම යන්න වේ.) | මුල් පිටපත | |
| 13. | අදාළ පළාත් සභාවේ සේවා කාලය තුළදී ඊට අදාළ වන කිසියම් කරුණක් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගයක් එම නිලධාරියාට එරෙහිව නොපවතින බවට ආයතන ප්‍රධානි නිර්දේශය සහිත වාර්තාව. | මුල් පිටපත | |
| 14. | නිලධාරියා සම්බන්ධයෙන් බරපතල මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව විගණන විමසුම් ඇති /නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී සහතිකය. | මුල් පිටපත | |
| 15. | අදාළ නිලධාරියා දැනට සේවයේ නියුතු පළාත් සභාවේ වියදමෙන් විශේෂ පුහුණුවක් ලබා තිබේ නම්, පුහුණුවට අදාළ ගිවිසුම්ගත අනිවාර්යය සේවා කාලය ඉකුත්වී තිබීම හෝ කිසියම් බැඳුම්කරයක යටත්කොට තිබී බැඳුම්කරයෙන් නිදහස් වී ඇති/නැති බවට ආයතන ප්‍රධානියා ගේ වාර්තාව. | මුල් පිටපත | |
| 16. | ස්ථාන මාරු අයදුම්කරුගෙන් අදාළ පළාත් සභාවට/රජයට අයවිය යුතු ණය ශේෂයන් පිළිබඳ අදාළ ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන වාර්තාව | මුල් පිටපත | |

ඇමුණුම - 03


දුරකථන / தொலைபேசி / Telephones } 011-2136600 / 011-2136650

ලේකම් / செயலாளர் / Secretary } 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2876169 / 011-2876181

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail } info@psc.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்

OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල

இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை

No. 1200/9, Rajamalwatta Road, Battaramulla


මගේ අංකය / எனது இல. / My No. } PSC/EST/06-05/0 2015

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024.07. 24

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 04/2020(1)

අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>නිලධරයාගේ ඉල්ලීම මත පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් දරන නිලධරයකු ජාතික සේවයේ අනුරූපී තනතුරකට අන්තර්ග්‍රහණය කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිකුත් කරන ලද 2020.01.30 දිනැති අංක 04/2020 චක්‍රලේඛයෙහි හා 2024.02.27 දිනැති අංක 01/2024 චක්‍රලේඛ ලිපියෙහි විධිවිධාන ප්‍රකාරව අදාළ බලධරයන් විසින් එතෙක් ගෙන ඇති තීරණවලට හෝ ක්‍රියාමාර්ගවලට අගතියක් නොවන පරිදි, මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින සිට ඉහත කී චක්‍රලේඛය හා චක්‍රලේඛ ලිපිය අවලංගු වේ.

02. ජාතික සේවයේ තනතුරකට අනුරූපී පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන හෙද සේවයේ, වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ, අතුරු වෛද්‍ය සේවයේ හා ගුරු සේවයේ නිලධරයකු, පහත i සිට viii දක්වා අවශ්‍යතා සපුරාලන්නේ නම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභිනියෝජිත බලය දරන අදාළ පත්කිරීම් බලධරයා විසින් එකී නිලධරයාගේ ඉල්ලීම මත ජාතික සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබිය හැකිය.

i. නිලධරයා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ Z අගය මත හෝ, උපාධිධරයකු නම්, දිවයින ව්‍යාප්ත විවෘත තරඟ විභාගයක ප්‍රතිඵල මත අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් තෝරාගනු ලැබීමෙන් අනතුරුව පළාත් රාජ්‍ය සේවයට බඳවා ගෙන තිබිය යුතුය.

ii. පළාත් රාජ්‍ය සේවයේ තනතුර දැරීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා වූ මූලික පුහුණුව අදාළ රේඛීය අමාත්‍යාංශය යටතේ ලබා තිබිය යුතුය.

iii. ජාතික සේවයේ අනුරූපී සේවා ව්‍යවස්ථාවේ/බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානවලට සමාන විධිවිධාන ඇතුළත් පළාත් රාජ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවකින්/බඳවා ගැනීමේ පටිපාටියකින් පාලනය වන තනතුරක් දැරිය යුතුය.

iv. පළාත් රාජ්‍ය සේවයේ අදාළ තනතුරෙහි පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

v. නිලධරයා කිසියම හෝ විනය ක්‍රියාමාර්ගයකට යටත්ව නොසිටිය යුතු අතර අදාළ පළාත් බලධරයින් විසින් නිලධරයාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොතිබිය යුතුය.

vi. පළාත් රාජ්‍ය සේවයේ සේවයට අදාළව නිලධරයාට එරෙහිව කිසිදු අධිකරණ ක්‍රියාමාර්ගයක් ආරම්භව නොතිබිය යුතුය.

vii. නිලධරයා පළාත් රාජ්‍ය සේවයෙන් ස්ථිරව මුදා හැරීමට අදාළ පළාත් පත්කිරීම් බලධරයාගේ එකඟතාව ලැබී තිබිය යුතුය. නිලධරයකු පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීමට අදාළ නියමයන් හා කොන්දේසි අදාළ පළාත් බලධරයින් විසින් තීරණය කළ යුතුය.

viii. තමන් මෙම චක්‍රලේඛයේ විධිවිධානවලට යටත්ව ජාතික සේවයේ තනතුර බාරගන්නා බවට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟවන බවට දිවුරුම් ප්‍රකාශයක් නිලධරයා විසින් ජාතික සේවයේ අදාළ පත්කිරීම් බලධරයාට ඉදිරිපත් කළ යුතුය.

03. මෙම චක්‍රලේඛ විධිවිධාන යටතේ ජාතික සේවයේ තනතුරකට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයකුගේ ජ්‍යෙෂ්ඨතාව, නිලධරයා පළාත් රාජ්‍ය සේවයේ තනතුරට පත්කරනු ලැබූ දිනයේදී ජාතික සේවයේ අදාළ තනතුරට පත්කරනු ලැබ ඇතැයි සලකා තීරණය කළ යුතුය. එසේ වුවද, පහත සඳහන් අවස්ථාවලදී හැර, මෙම චක්‍රලේඛයේ විධිවිධාන යටතේ ජාතික සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබ ඇති නිලධරයකු ජ්‍යෙෂ්ඨතාව නිර්ණායකයක් වන තෝරා ගැනීමකින් සිදු කරනු ලබන උසස් කිරීමක් සඳහා අන්තර්ග්‍රහණයෙන් වසර තුනක් (03) ඉකුත් වන තුරු සුදුසුකම නොලබන්නේය.

i. උසස් කිරීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ ප්‍රමාණවත් නිලධරයන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති අවස්ථාවකදී

ii. පළාත් රාජ්‍ය සේවයේ පෙර තනතුර දරමින් සිටියේ නම් වුවද අයදුම් කිරීමට සුදුසුකම ලබන්නා වූ උසස් කිරීම්

04. පළාත් රාජ්‍ය සේවයෙන් ජාතික සේවයට අන්තර්ග්‍රහණය වීමට ඉදිරිපත් වන සෑම ඉල්ලීමක් සම්බන්ධයෙන්ම අදාළ පත්කිරීම් බලධරයින් අන්‍යෝන්‍ය එකඟතාවයක් අනුව කටයුතු කළ යුතුය.

05. මෙම චක්‍රලේඛ විධිවිධාන යටතේ ජාතික සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන සෑම නිලධරයකුටම ජාතික සේවයේ අදාළ පත්කිරීම් බලධරයා විසින් නව පත්කිරීම් පාලනය වන නියමයන් හා කොන්දේසි ඇතුළත් තනතුරට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපියක් නිකුත් කළ යුතුය. මේ සඳහා පත්කිරීම් බලධරයින් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 3 වැනි පරිශිෂ්ටයේ දැක්වෙන ආදර්ශ පත්කිරීම් ලිපිය අවශ්‍ය වෙනස් කිරීම් සහිතව භාවිතා කළ යුතුය.

මෙම චක්‍රලේඛය 2024.07.24 දින සිට ක්‍රියාත්මක වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

Ndayal

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ.දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව